සැ. යු. - 2024.05.10 දින පළ කරන ලද අංක 2384 *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,385 - 2024 මැයි මස 17 වැනි සිකුරාදා - 2024.05.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 490 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 499 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 500 |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජුනි 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මැයි 22 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2024.01.24 වැනි දින තීරණ අංක 2024/01/24/530-17 යටතේ මෙහි පහත සඳහන් තීරණය සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එන්. තිලකරත්න,
ලේකම්,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2024 අප්‍රේල් මස 29 වැනි දින.

තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපලක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම පහසු කිරීමටත් සහ 2016 අංක 123 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 වන සහ 5 වන වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ගැනීම සඳහා ද එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සැපයීමට නියම කළ යුතු යැයි, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය."

ලේකම්,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

05-144

---

## දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

ගෝඝාතන ආඥාපනත (272 වැනි අධිකාරිය) යටතේ විරෝධතා කැඳවීමයි

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය එහි සඳහන් වන ස්ථානයේ 2024 වර්ෂයේ ඌරුමස් වෙළඳාම කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් වී සිටින බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7(2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම මස්කඩය සඳහා 2024 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ දිවුලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය ඊට විරුද්ධ වන්නේ කුමන කාරණයක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| *අනු. අංක* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *මස් කඩය පවත්වන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 01 | රාජපක්ෂ මහා පතිරනලාගේ රුක්මාල් නිශාන්ත ෆොන්සේකා | අංක 264/1 A, 7 කණුව, කටාන | ඌරුමස් වෙළඳාම |

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල
කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
දිවුලපිටිය ප්‍රාදේශීය සභාව,
දිවුලපිටිය.

05 -206

## වවුනියාව නගර සභාව

### වවුනියාව නගර සභාවේ කුලී දේපළ පිළිබඳ ගිවිසුම අලුත් කිරීම දැනුම් දීම

වවුනියාව නගර සභාවේ සියලුම කුලී දේපළ 2024.07.01 දින අළුත් කිරීමට තීරණය කර ඇත. එබැවින් 2024.06.01 දිනට පෙර අදාළ ලියකියවිලි සමග කාර්යාල වේලාවට පැමිණ ගිවිසුම් අත්සන් කරන ලෙස ඉල්ලා සිටිමු. එසේ කිරීමට අපොහොසත් වුවහොත්, කුලී දේපළ පිළිබඳ ගිවිසුම සභාව විසින් සමාලෝචන කරනු ලැබේ.

ලේකම්,
නගර සභාව,
වවුනියාව.

05-272

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ විරෝධතා කැඳවීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම, ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.


02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එස්. කේ. ගුණසේකර,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

**ලියාපදිංචි කළ යුතු මාර්ගය**

***මිනින්දෝරු සැලැස්ම සහිත***

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරි වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (අඩි)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | 31 පෙතියාගොඩ නැගෙනහිර | තාවල්පිටිය මාර්ගය | කේළමදෙනිය පෙතියාගොඩ මාර්ගය | පල්ලේ අළුදෙණිය රෝහල් මාර්ගය | එන්. එදිරිසිංහ<br>එන්. ජී. එල්. ප්‍රියදර්ශන<br>පී. එන්. ජී. එන්. ප්‍රියදර්ශන<br>අයි. ජී. එස්. එස්. අබේවික්‍රම<br>ඊ. ඒ. ඒ. අබේවික්‍රම<br>ටී. ජී. අජිත් ප්‍රියන්කර | ඩී. ජී. ඒ. පී. කුමාර<br>ඩී. ඩී. එල්. ප්‍රියන්තර<br>එම්. එම්. ජී. සී. කුමාර<br>ඩී. ඩී. එල්. රූපිකා<br>ඩී. ජී. රත්නසේන<br>ඩී. ජී. කරුණාරත්න | 330 | 6 |


Surveyor & Leveller
PLAN No:4065
Thawalpitiyewatta
Land of D.G.A.P.Kumara
D.G.L.Priyankara & M.M.G.C.Kumara
Lot 160 in CM320260(Block-1)
Farmtanwatta
Land of N.Edirisinghe
Lot 159 in CM320260(Block-1)
Thawalpitiyewatta
Land of D.G.L.Rupika
Lot 163 in CM320260(Block-1)
Farmtanwatta
N.G.L.Priyadarshana & P.N.G.S.Priyadarshana
Lot 166 in CM320260(Block-1)
Kotikambegodawatta
Land of D.G.Rathnasena
Lot 164 in CM320260(Block-1)
Kotikambegodawatta
of I.G.S.S.Abeywickrama
and E.A.A.Abeywickrama
167 in CM320260(Block-1)
Path
A
Kotikambegodawatta
Land of D.G.Karunarathna
Lot 169 in CM320260(Block-1)
Farmtanwatta
Land of T.G.Ajith Priyankara
168 in CM320260(Block-1)
From Petiyagoda
Road(PS) To Gelioya
Reference
B Bank
St Stake
LF Live Fence
L Land mark
CP Concreet Post
P Permanent building
Road(PS) Road(Pradeshiya Sabawa)
cpc/unps/3/4/1/102
Scale : 1:1000
PLAN
of an allotment of Land called
Kotikambegodawatta
Part of Lot 165 in CM320260(Block-1),Sheet-1 by Surveyor General
Situated at Petiyagoda Village
Petiyagoda East(31) G.S.Division,Udunuwara Pradeshiya Sabawa
Gangepalatha Korale of Udunuwara D.S.Division
KANDY DISTRICT
CENTRAL PROVINCE
Surveyed in: 05/11/2023
Lot No: | Extent Ha. | A. | R. | Pa. | Remarks
A | 0.0190 | 0 | 0 | 7.50
Total | 0.0190 | 0 | 0 | 7.50
Boundaryes Pointed Out by N.G.L.Priyadharshana & Others

**උඩ පළාත ප්‍රාදේශීය සභාව**

විරෝධතා කැඳවීම

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මාර්ග උඩපළාත ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව හෝ මාර්ගයට අදාළ ඉඩම්හිමිකරුවන්ගේ හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට මාස තුනක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයක නඩුවක් පවරා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් පහත උපලේඛනයේ සඳහන් මාර්ග උඩපළාත ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එස්. එම්. කේ. ජී. එස්. සුබසිංහ,
ලේකම්,
උඩපළාත ප්‍රාදේශීය සභාව.

2023 මැයි මස 06 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය සභාව,
දූල්පිටිය, අටබාගේ දී ය.


*උපලේඛනය*


| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *පිඹුරු පත් අංකය* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | මිල්ලගහමුල සිට කාසල් මිල්ක් හන්දිය දක්වා පාර | මිල්ලගහමුල හන්දිය ගුණතිලක ස්ටෝස් අසලින් | කාසල් මිල්ක් හන්දිය | 1. ඩබ්. ජී. ජී. ගුණතිලක මයා හිමිකම් කියන ඉඩම ගුණතිලක ස්ටෝර්ස්<br>2. එන්. ජී. බණ්ඩාර මයා හා තවත් අය හිමිකම් කියන ඉඩම<br>3. ඩබ්. ජී. ඒ. රත්නසිංහ මයා හිමිකම් කියන ඉඩම<br>4. ඩබ්. එන්. බණ්ඩාර මයා සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>5. ප්‍රියන්ත වික්‍රමසිංහ මයා හිමිකම් කියන ඉඩම<br>6. ඩී. එම්. එන්. පණ්ඩුලරත්න මයා හිමිකම් කියන ඉඩම | 1. නිහාල් රූපටි ජයසූරිය මයා හිමිකම් කියන ඉඩම<br>2. කාසල් මිල්ක් උඩ පාර (තේවත්ත දෙසට)<br>3. ප්‍රේමා මිය හිමිකම් කියන ඉඩම<br>4. පී. කේ. එන්. ජී. ටී. බී. නීලවල මයා හිමිකම් කියන ඉඩම<br>5. රණසිංහ මයා සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>6. ඊ. ජී. ගුණදාස මහතා හිමිකම් කියන ඉඩම<br>7. වී. ඒ. ඉන්දික රුක්මාල් මයා හිමිකම් කියන ඉඩම | 4004 | 1725 | අවමය අඩි 15 සිට පිඹුරේ දක්වා ඇති පරිදි |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | පිඹුරු පත් අංකය | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 7. ඩී. ජී. පණ්ඩුලරත්න මයා හිමිකම් කියන ඉඩම<br>8. ඩබ්. ජී. මාටින් මයා හිමිකම් කියන ඉඩම<br>9. යූ. බී. ඉන්දික සමන් කුමාර මයා හිමිකම් කියන ඉඩම<br>10. ඩබ්. ඒ. නිහාල් තිලකරත්න මයා හිමිකම් කියන ඉඩම<br>11. රූපා වසන්ති මිය හිමිකම් කියන ඉඩම<br>12. එම්. ජී. බේබිනෝනා මිය හිමිකම් කියන ඉඩම<br>13. ඩබ්. ජී. සෝමරත්න මයා හිමිකම් කියන ඉඩම<br>14. ඩබ්. ජී. සිරිපාල මයා හිමිකම් කියන ඉඩම<br>15. එච්. ජී. ජයතිලක මයා හිමිකම් කියන ඉඩම<br>16. එච්. ජී. සිරිසේන මයා හිමිකම් කියන ඉඩම<br>17. එච්. ජී. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම<br>18. ඊ. එම්. ටිකිරි මැණිකේ මිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>19. මිල්ලගහමුල දෙසට ගොවි සෙවන මාර්ගය<br>20. යූ. ජී. එම්. සුනිල් ශාන්ත මයා හිමිකම් කියන ඉඩම<br>21. කාසල් මිල්ක් බංගලාවට යන පාර<br>22. කාසල් මිල්ක් තේ වත්ත | 8. ඩී. ජී. චන්ද්‍රාවතී මිය හිමිකම් කියන ඉඩම<br>9. ඩී. ජී. සුමනදාස මයා සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>10. ඩී. ජී. ලයනල් හරිසචන්ද්‍ර මයා හිමිකම් කියන ඉඩම<br>11. කටුපදුරේ මඩ ගම අසලින් එකේ කැල්ලට යන පාර<br>12. බුදු මැදුර<br>13. ඩී. ජී. සුමනසිරි මයා හිමිකම් කියන ඉඩම<br>14. කේ. සමන් කුමාර කොළඹගේ මයා සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>15. ඩබ්. ජී. ජයසේන මයා හිමිකම් කියන ඉඩම<br>16. ආර්. ජී. සිරිවර්ධන මයා හිමිකම් කියන ඉඩම<br>17. වයි. ජී. කුසුමාවතී මිය හිමිකම් කියන ඉඩම<br>18. ආර්. ජී. චන්ද්‍රපාල මයා හිමිකම් කියන ඉඩම<br>19. ඩී. ජී. තිලකරත්න මයා හිමිකම් කියන ඉඩම<br>20. ඊ. එම්. ටිකිරිමැණිකේ මිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>21. කාසල් මිල්ක් තේ කර්මාන්ත ශාලාව පිහිටි තේ ඉඩම<br>22. එම්. එම්. රේණුකා දමයන්ති මිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>23. කාසල් මිල්ක් තේ වත්ත | | | |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | පිඹුරු පත් අංකය | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|---|
| 02 | කාසල් මිල්ක් ගොවි සෙවන පාර | මිල්ලගහමුල සිට කාසල් මිල්ක් හන්දිය දක්වා පාර | ග්‍රෝව්හිල් සිට මිල්ලගහ මුල දක්වා යන ප්‍රාදේශීය සභා පාර | 1. ඊ. එම්. ටිකිරි මැණිකේ මිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>2. ප්‍රියන්ත මයා හිමිකම් කියන ඉඩම<br>3. බී. ඩබ්. සෝමාවතී මිය හිමිකම් කියන ඉඩම<br>4. ශාන්ත නවරත්න මයා හිමිකම් කියන ඉඩම<br>5. සෙනවිරත්න මයා හිමිකම් කියන ඉඩම<br>6. කරුණාරත්න මයා හිමිකම් කියන ඉඩම<br>7. යූ. ජී. එම්. ගාමිණී ශාන්ත මයා හිමිකම් කියන ඉඩම<br>8. ගොවිජන සේවා මධ්‍යස්ථානය<br>9. ඩබ්. ජී. ගුණතිලක මයා හිමිකම් කියන ඉඩම<br>10. ආනන්ද දොරවක මයා හිමිකම් කියන ඉඩම<br>11. බණ්ඩාර මයා හිමිකම් කියන ඉඩම<br>12. ටී. ජී. ජයවර්ධන මයා හිමිකම් කියන ඉඩම<br>13. ඩබ්. ජී. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම<br>14. පැටි මයා හිමිකම් කියන ඉඩම<br>15. සරත් විමලධර්ම මයා හිමිකම් කියන ඉඩම<br>16. නිලංග කරුණාසේන මයා හිමිකම් කියන ඉඩම<br>17. එම්. ජී. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම | 1. එම්. ජී. ප්‍රේමලතා මිය හිමිකම් කියන ඉඩම<br>2. එස්. ජී. ධර්මදාස මයා හිමිකම් කියන ඉඩම<br>3. ජේ. එම්. ලොකුබණ්ඩා මයා හිමිකම් කියන ඉඩම<br>4. කේ. ටී. ජී. නන්දවතී මිය හිමිකම් කියන ඉඩම<br>5. එ. එච්. ඒ. කිරිබණ්ඩා මයා හිමිකම් කියන ඉඩම<br>6. ඊ. කේ. ජී. තිලකරත්න මයා හිමිකම් කියන ඉඩම<br>7. කේ. ඒ. තිලකරත්න මයා හිමිකම් කියන ඉඩම<br>8. එච්. ජී. සුනිල් කුමාර මයා හිමිකම් කියන ඉඩම<br>9. වී. ජී. එම්. මහින්දකුමාර මයා හිමිකම් කියන ඉඩම<br>10. ඩී. ඩබ්. ඒ. ජයතිලක හාමිනේ මිය හිමිකම් කියන ඉඩම<br>11. එම්. ජී. පොඩිනෝනා මිය හිමිකම් කියන ඉඩම<br>12. එම්. ජී. සුමනදාස මයා හිමිකම් කියන ඉඩම<br>13. රම්‍යලතා මිය හිමිකම් කියන ඉඩම<br>14. ඩබ්. ජී. රංජිත් විමලසේන මයා හිමිකම් කියන ඉඩම<br>15. කේ. ජී. ප්‍රසන්න ගුණතිලක මයා හිමිකම් කියන ඉඩම | 4004B | 1420 | අවමය අඩි 15 සිට පිඹුරේ දක්වා ඇති පරිදි |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | පිඹුරු පත් අංකය | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 18. ඩබ්. ජී. විජේසේකර මයා හිමිකම් කියන ඉඩම<br>19. එච්. ජී. කීර්තිරත්න මයා හිමිකම් කියන ඉඩම | 16. ප්‍රාදේශීය සභා පුස්තකාලය<br>17. ධර්මසේන මයා හිමිකම් කියන ඉඩම<br>18. පී. ජී. ගුණපාල මයා<br>19. ආර්. ජී. කනිෂ්ක මයා හිමිකම් කියන ඉඩම<br>20. කේ. ජී. ටී. බිසෝමැණිකේ මිය හිමිකම් කියන ඉඩම | | | |




කාසල්මිල්ක් - හඳබිම මාර්ගය
පිඹුරු අංකය:-4004B
පරිමාණය:- 1: 2000
මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ
දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ,
කඳුකර පහල කෝරළේ
උඩපලාත ප්‍රාදේශීය සභා සීමාව තුල
1145-ගොනටුවල ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ
ගොනටුවල ගමේ පිහිටි
කාසල්මිල්ක් - හඳබිම මාර්ගය
මැන පෙන්වන
පිඹුර

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාර්ෂික ගිණුම් වාර්තාව ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති අංක 171 ප්‍රකාරව, 1989 අප්‍රේල් 17 දිනැතිව අංක 554/5 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත, ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ රීති අංක 216 වැනි වගන්තිය යටතේ සහ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2024.03.28 දින තීරණ අංක 2024/2448 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ජී. නිශ්ශංක,
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොළ.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති අංක 171 ප්‍රකාරව, 1989 අප්‍රේල් 17 දිනැතිව අංක 554/5 *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත, ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ රීති අංක 216 ට අනුව පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයට අදාළ පහත උපලේඛනයේ සඳහන් වාර්ෂික ගිණුම් වාර්තාව ප්‍රකාශයට පත් කළ යුතු බවට තීරණ කරමි.

***උපලේඛනය***

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

*2023 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය*

| | *සටහන්* | *2023.12.31 රු. ශත* | *2022.12.31 රු. ශත* |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 06 | 749,555,722.00 | 507,485,035.00 |
| ජංගම වත්කම් | | | |
| තොග | 07 | 11,418,508.00 | 9,935,387.00 |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 11,402,671.00 | 11,825,004.00 |
| ලැබිය යුතු දෑ | 09 | 71,198,821.00 | 137,696,536.00 |
| ආයෝජන | 10 | 117,490,963.00 | 45,259,238.00 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 15,414,774.00 | 25,729,039.00 |
| | | 226,925,737.00 | 230,445,204.00 |
| **මුළු වත්කම්** | | **976,481,459.00** | **737,930,239.00** |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 93,892.00 | 761,313.00 |
| ජංගම වගකීම් | 13 | 90,088,477.00 | 31,530,694.00 |
| හිමිකම් | 14 | 886,299,090.00 | 705,638,232.00 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **976,481,459.00** | **737,930,239.00** |

# විවිධ දැන්වීම්

සංශෝධනයයි

**හපුතලේ ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා හපුතලේ ප්‍රදේශීය සභාවට අයත් කඩ කාමරවල බදු අයිතිය පැවරීමේ ගාස්තු සංශෝධනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව තීරණ අංක 2024/03/21/633 යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවට අදාළ පහත තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. පී. සී. කුලසේකර,
සභා ලේකම්,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2024 මාර්තු මස 21 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**තීරණය**

***තීරණ අංක 2024/03/21/633***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල යටතේ 2024 වර්ෂයේ සිට හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමරවල බදු අයිතිය වෙනත් පාර්ශවයකට පැවරීමේ දී පහත උපලේඛනයේ සඳහන් පරිදි මෙකී තීරණය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට එකී උපලේඛනයේ (ii) තීරුවේ අනුප්‍රමාණික ගාස්තුවක් අය කිරීමට නියම කළ යුතු බවට මම තීරණය කරමි.

*උපලේඛනය*

| *අනු. අංකය* | *I තීරුව විස්තරය* | *II තීරුව රු. ශත* |
|---|---|---|
| 01 | දියතලාව නගරයේ තාවකාලික කඩ කාමර සඳහා | 100,000.00 |
| 02 | දියතලාව නගරයේ පොදු වෙළඳපොළ කඩ කාමර සඳහා | 150,000.00 |
| 03 | දියතලාව නගරයේ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා | 200,000.00 |
| 04 | දියතලාව නගරයේ නව බස් නැවතුම්පොළ කඩ කාමර සඳහා | 200,000.00 |

05-203

---

**හපුතලේ ප්‍රාදේශීය සභාව**

හපුතලේ ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව හා 2013 ජුනි මස 28 දිනැති අංක 1816/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථාවේ 23 කොටස - සංචාරක වෙළඳාමට අදාළ අතුරු ව්‍යවස්ථාවට යටත්ව 2024/04/03 දින තීරණ අංක 11 යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවට අදාළ පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. එම්. පී. සී. කුලසේකර,
ලේකම්,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2024 මැයි මස 06 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

**තීරණය**

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2013 ජුනි 28 දිනැති අංක 1816/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථාවේ 23 වන කොටස සංචාරක වෙළඳාමට අදාළ අතුරු ව්‍යවස්ථාවේ 02 හා 03 වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු පනවා නොමැති හෙයින්,

සංචාරක වෙළඳාම සම්බන්ධයෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි (II) තීරුවේ අනුප්‍රමාණික ගාස්තුවක් අය කිරීමට නියම කළ යුතු බවට මා තීරණය කරමි.

*උපලේඛනය*

| *අනු. අංකය* | *I තීරුව විස්තරය* | *II තීරුව රු. ශත* |
|---|---|---|
| 01 | මෝටර් වාහන/ත්‍රීවීල් මගින් වෙළඳාම් කිරීම | 50,000.00 |
| 02 | යතුරු පැදි මගින් වෙළඳාම් කිරීම | 30,000.00 |
| 03 | පාපැදි /අත් කරත්තය මගින් වෙළඳාම් කිරීම | 25,000.00 |
| 04 | අතින් රැගෙන ගොස් වෙළඳාම් කිරීම | 20,000.00 |

05-204

---

**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් සඳහා අය කිරීම සම්බන්ධයෙන් 2024.01.09 දිනැති තීරණ අංක 2024/01/09/34 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2024 අප්‍රේල් මස 24 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

**තීරණය**

2023.11.17 දින පළ වූ රජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් වූ සභාව සතු දේපළ කුළියට ලබා දීමේ දී අය කරනු ලබන ගාස්තු සංශෝධනය සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (අ) හා 122-126 වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV (ආ) ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 වැනි දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, දකුණු පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වැනි දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල i-xxx (iv හැර) දක්වා වූ කාණ්ඩවල ඇතුළත් xxviii වන ප්‍රචාරක දැන්වීම්, පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, ගඟකට, මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ විස්තර පරිදි II වැනි තීරුවේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් *ගැසට් පත්‍රය* පළවන දින සිට අය කළ යුතු බවට කාරක සභාව නිර්දේශ කළ බැවින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කළෙමි.

**උපලේඛනය 01**

| | *I වැනි තීරුව*<br>*විස්තරය* | *II වැනි තීරුව*<br>*බලපත්‍ර ගාස්තුව මසක් හෝ ඉන් කොටසක් සඳහා රු. ශත* |
|---|---|---|
| I. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග මීටරයකට ම | 550 0 |
| II. | ලෑල්ලක් හෝ ආධාරකයක් හෝ බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග මීටරයකට ම | 550 0 |
| III. | චිත්‍රපට දර්ශන ප්‍රචාරය සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග මීටරයකට ම | 435 0 |
| IV. | බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රදීප්ත දැන්වීමක් සඳහා සෑම වර්ග මීටරයකට ම | 550 0 |
| V. | තාවකාලික ප්‍රදර්ශන පුවරු (කටවුට්) සඳහා සෑම වර්ග මීටරයකට ම | 550 0 |

තව ද, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා එක් වර්ෂයකට වර්ග මීටරයකට රු. 4,350.00 ක මුදලක් අය කරනු ලැබේ.

05-205/1

---

**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා බිම්බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව බිම්බදු සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2024.01.09 දිනැති තීරණ අංක 2024/01/09/32 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2024 අප්‍රේල් මස 24 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

**තීරණය**

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට අයත් රැස්වීම් ශාලාව කුලියට දීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි 2024 වර්ෂයේ සංශෝධිත *ගැසට් පත්‍රය* පළ වන දින සිට අය කළ යුතු බවට තීරණය කරමි.

**උපලේඛනය**

රැස්වීම් ශාලාව වෙන් කිරීමේ දී

- රැස්වීම් ශාලාව වෙන් කිරීම සඳහා රු. 8,000.00 ක ඇප තැන්පතු මුදලක් හා දිනකට රු. 12,000.00 ක මුදලක් ද, අය කරනු ලැබේ. (ජලය හා විදුලිය, පුටු ශාලා පහසුකම් සඳහා පමණක් අදාළ වේ.)

- රැස්වීම් සහ සම්මන්ත්‍රණ ආදිය සඳහා රැස්වීම් ශාලාව වෙන් කිරීමේ දී :

  පාසලකට හෝ ආගමික කටයුත්තකට දිනකට රු. 5,000.00 ද, වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයකට දිනකට රු. 6,000.00ක මුදලක් ද අයකරනු ලැබේ. මෙහි ඇප තැන්පතුව රු. 8,000.00 කි.

  පුහුණුවීම් සඳහා පෙර දිනය ලබා ගන්නේ නම් රු. 5,000.00 ක මුදලක් හා රු. 8,000.00ක ඇප තැන්පතුවක් තැබිය යුතුය.

  (මෙම ගාස්තුව සඳහා ජලය හා විදුලිය, පුටු හා ශාලා පහසුකම් සඳහා පමණක් අදාළ වේ.)

- ශබ්ද පරිපාලන පද්ධතිය ලබා ගැනීම සඳහා දිනකට රු. 2,000.00 ක මුදලක් ද, ප්‍රොජෙක්ටර් යන්ත්‍රය සඳහා පැය 01 කට රු. 1,000.00 ක මුදලක් අය කරනු ලැබේ.

05-205/2

---

**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා ජල බවුසරය කුළියට ලබා දීමේ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ජල බවුසරය කුලියට දීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2024.01.09 දිනැති තීරණ අංක 2024/01/09/31 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2024 අප්‍රේල් මස 24 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

**තීරණය**

"යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ලීටර් 4000ක ජල පරිමාවක් ඇති ජල බවුසරය 2024 වර්ෂයේ සංශෝධිත *ගැසට් පත්‍රය* පළවන දින සිට පහත සඳහන් පරිදි ගාස්තු අය කළයුතු බවට තීරණය කරමි"

ජලය සමග බවුසරය ලබා දීමේ දී එක් දිනකට,

- ජලය සහිතව රු. 3.5000.00 ක් ද,
- ජලය රහිතව රු. 2,000.00 ක් ද අය කරනු ලැබේ.
- ජල බවුසරය ජලය රහිතව හෝ සහිතව ඇප තැන්පතු මුදල රු. 5,000 කි.

සභා බල ප්‍රදේශය තුළ ප්‍රවාහනය කිරීම සඳහා රු. 1,000.00ක් ද, බල ප්‍රදේශයෙන් පිට ප්‍රවාහනය සඳහා රු. 3,000.00 ක මුදලක් ද අය කරනු ලැබේ.

02-205/3

**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා ටොන් 08ක ගල් රෝල කුලියට ලබාදීම සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව යක්කලමුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව ටොන් 08ක ගල් රෝල කුලියට ලබා දීම සඳහා ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් 2024.01.09 දිනැති තීරණ අංක 2024/01/09/33 යටතේ පහත සඳහන් තීරණය ලබා ගත් බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එම්. සී. හේරත්,
ලේකම්,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2024 අප්‍රේල් මස 24 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව,
යක්කලමුල්ල.

**තීරණය**

2023.11.17 දින පළ වූ රජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් වූ සභාව සතු දේපළ කුලියට ලබා දීමේ දී අය කරනු ලබන ගාස්තු සංශෝධනය සම්බන්ධව, යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතු ටොන් 8 ක ගල් රෝල 2024 වර්ෂයේ දී කුලියට ලබා දීමේ දී පහත සඳහන් සංශෝධිත ගාස්තු නැවත *ගැසට් පත්‍රය* පළවන දින සිට අය කිරීමට නිර්දේශ කළ බැවින් ඒ අනුව සංශෝධිත ගාස්තු අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කළෙමි.

* එක් දිනයක් සඳහා රු. 20,000.00 ක මුදලක් ද, සහ ඉන් අනතුරුව වැඩිවන සෑම පැය එකකටම රු. 2,000.00 ක ගාස්තුවක් අය කරනු ලැබේ. (එක් දිනක් සඳහා පැය 08ක් අදාළ වේ.)

* ඒ සඳහා නැවත නිදහස් කරනු ලබන ඇප තැන්පත් මුදලක් ලෙස බල ප්‍රදේශය තුළ රු. 10,000 0 ක මුදලක් ද කිලෝමීටර් 10 කට වැඩි දුරක් ඇති වැඩ බිමක් සඳහා රැගෙන යාමේ දී රු. 15,000.00 ක ඇප තැන්පතු මුදලක් ද අය කරනු ලැබේ.

* ගල් රෝල කාර්මික දෝෂයක් හෝ රියදුරුවරයෙකු නොමැති අවස්ථාවක හැර මුදල් ගෙවා ලබා ගන්නා දින ගණනට අමතරව වැඩ බිමෙහි රඳවා ගන්නා එක් දිනක් සඳහා රු. 2,000.00 ක මුදලක් අය කරනු ලැබේ.

  ගල් රෝල ප්‍රවාහනය සඳහා පහත පරිදි ප්‍රවාහන ගාස්තු අය කරනු ලැබේ.

ප්‍රවාහන ගාස්තුව :

1. කි.මී. 00 සිට 05 ඇතුළත ප්‍රවාහනය සඳහා රු. 4,000.00
2. කි.මී. 05 ඇතුළත පමණක් ඉහත ගාස්තු යටතේ ප්‍රවාහනය සභාව විසින් සිදු කරනු ලබන අතර ඊට වැඩි වන අවස්ථාවලදී ප්‍රවාහන පහසුකම් තමා විසින් සපයා ගත යුතුය.

05-205/4

---

සංශෝධනයයි

**කොලොන්න ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා සතිපොළ සේවා සඳහා ගාස්තු අය කිරීම සංශෝධනය කිරීම

2023.12.01 වැනි දින අංක 2361 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද 12-07/15 නිවේදනයෙහි සඳහන් කොලොන්න ප්‍රාදේශීය සභාවේ සතිපොල සඳහා ගාස්තු අය කිරීම පහත පරිදි සංශෝධනය විය යුතු බව කොලොන්න ප්‍රාදේශීය සභාවේ 2024.02.21 දිනැති අංක 12 තීරණය යටතේ තීරණය කරනු ලැබ ඇති බවත්, එම තීරණය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට ක්‍රියාත්මක වන බවත් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

පී. ඒ. මාලිකා,
ලේකම් හා බලතල කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කොලොන්න ප්‍රාදේශීය සභාව.

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | *වෙළඳාම් වර්ගය* | *කොලොන්න සතිපොළ* | | *කැල්ල සතිපොළ* | | *ගොඩවෙල සතිපොළ සතියකට දෙවරක්* | | *සූරියකන්ද සතිපොළ* | |
| | | වර්ග අඩි | අය කරනු ලබන ගාස්තු රු. ශත | වර්ග අඩි | අය කරනු ලබන ගාස්තු රු. ශත | වර්ග අඩි | අය කරනු ලබන ගාස්තු රු. ශත | වර්ග අඩි | අය කරනු ලබන ගාස්තු රු. ශත |
| 1 | සිල්ලර වෙළෙඳාම | 6x5 | 200 0 | 6x5 | 130 0 | 6x5 | 100 0 | 6x5 | 100 0 |
| 2 | එළවළු වෙළෙඳාම | 6x5 | 200 0 | 6x5 | 130 0 | 6x5 | 100 0 | 6x5 | 100 0 |
| 3 | රෙදි වෙළෙඳාම | 8x6/6x5 | 200 0 | 8x5 | 130 0 | 10x10 | 100 0 | 10x5 | 100 0 |
| 4 | වළං වෙළෙඳාම | 8x6 | 150 0 | | 100 0 | 10x10 | 80 0 | 10x10 | 50 0 |
| 5 | මාළු (පෙට්ටි) | | 1,000 0 | | 800 0 | | 500 0 - 600 0 | | 300 0 - 500 0 |
| 6 | මාළු (වෑන්) | | 1,500 0 | | 1,000 0 | | 600 0 | | 800 0 |
| 7 | අයිස්ක්‍රීම් | | 150 0 | | 100 0 | | 50 0 | | 50 0 |
| 8 | බේකරි කෑම | | 700 0 | | 600 0 | | 400 0 | | 200 0 |
| 9 | පලා වර්ග | | 150 0 | | 130 0 | | 40 0 - 50 0 | | 60 0 |
| 10 | බුලත්, පුවක්, දුම්කොළ වෙළෙඳාම | 6x5 | 150 0 | 6x5 | 130 0 | 6x5 | 100 0 | | 100 0 |
| 11 | තේ කඩ | | 300 0 | | 200 0 | | 100 0 | | 50 0 |
| 12 | තේ කොළ | 6x5 | 150 0 | 6x5 | 100 0 | 6x5 | 50 0 | | 50 0 |
| 13 | පොල් (ගෙඩියකින්) | | 5 0 | | 4 0 | | 4 0 | | 4 0 |
| 14 | ජංගම වෙළෙඳාම (රෙදි) | | 250 0 | | 200 0 | | 200 0 | | 100 0 |
| 15 | ජංගම වෙළෙඳාම (පළතුරු) | | 250 0 | | 200 0 | | 200 0 | | 100 0 |
| 16 | ජංගම වෙළෙඳාම (වෙනත්) | | 250 0 | | 150 0 | | 60 0 | | 50 0 |
| 17 | කෙසෙල් කැන් 01 කින් | | 20 0 | | 20 0 | | 10 0 | | 10 0 |
| 18 | රස කැවිලි | | 150 0 | 6x5 | 130 0 | | 80 0 | | 80 0 |
| 19 | ලොතරැයි වෑන් | | 200 0 | | 150 0 | | 100 0 | | 100 0 |
| 20 | පළතුරු වෑන් රථයකින් | | 250 0 | | 250 0 | | 150 0 | | 100 0 |
| 21 | තොග බඩු | | 10% | 6x5 | 8% | | 8% | | 8% |
| 22 | ප්ලාස්ටික් බඩු, වීදුරු බඩු | 6x5 | 200 0 | | 150 0 | | 80 0 | | 60 0 |
| 23 | සෙල්ලම් බඩු | 6x5 | 200 0 | | 150 0 | | 80 0 | | 60 0 |
| 24 | තොග බඩු ලොකු ලොරියකින් | | 1,000 0 | | 1,000 0 | | 1,500 0 | | 800 0 |
| 25 | තොග බඩු පොඩි ලොරියකින් | | 750 0 | | 750 0 | | 750 0 | | 750 0 |
| 26 | ෂෝටීස් බයිසිකලයකින් | | 100 0 | | 100 0 | | 80 0 | | 80 0 |

සංශෝධනයයි

**කොලොන්න ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා ජල සේවා සඳහා ගාස්තු අය කිරීම සංශෝධනය කිරීම

2023.12.01 වැනි දින අංක 2361 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 12-07/14 නිවේදනයෙහි සඳහන් කොලොන්න ප්‍රාදේශීය සභාවේ ජල සේවා සඳහා ගාස්තු අය කිරීම පහත පරිදි සංශෝධනය විය යුතු බව කොලොන්න ප්‍රාදේශීය සභාවේ 2024.04.03 දිනැති අංක 03 තීරණය යටතේ තීරණය කරනු ලැබ ඇති බවත්, එම තීරණය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට ක්‍රියාත්මක වන බවත් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

පී. ඒ. මාලිකා,<br>ලේකම් හා බලතල කාර්යය, කර්තව්‍ය<br>ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>කොලොන්න ප්‍රාදේශීය සභාව.

| | *I තීරුව* | *II තීරුව* | |
|---|---|---|---|
| | | *ගෘහ කාර්යයන් සඳහා (මාසිකව)* | *ව්‍යාපාරික කාර්යයන් සඳහා (මාසිකව)* |
| | | *රු. ශත* | *රු. ශත* |
| 01. | ස්ථාවර ගාස්තු | 300.00 | 400.00 |
| 02. | අක්‍රිය මනු සඳහා | 300.00 | 400.00 |
| 03. | කොලොන්න ජල සේවාව (මාසික ගාස්තු) | 200.00 | 200.00 |
| 04. | නව ජල සබඳතා ලබා දීමේ දී සේවා ගාස්තු | 11,687.00 | 11,687.00 |
| 05. | නව ජල සබඳතා ලබා දීමේ දී තැන්පතු ගාස්තු | 1,000.00 | 1,000.00 |
| 06. | නැවත ජල සම්බන්ධතාවය ලබා දීමේ ගාස්තුව | 1,000.00 | 1,000.00 |

05-145/2

---

සංශෝධනයයි

**කොලොන්න ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා දූන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීම සංශෝධනය කිරීම

2023.12.01 වැනි දින අංක 2361 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 12-07/11 නිවේදනයෙහි සඳහන් කොලොන්න ප්‍රාදේශීය සභාවේ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීම පහත පරිදි සංශෝධනය විය යුතු බව කොලොන්න ප්‍රාදේශීය සභාවේ 2023.12.29 දිනැති අංක 21 තීරණය යටතේ තීරණය කරනු ලැබ ඇති බවත්, එම තීරණය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට ක්‍රියාත්මක වන බවත් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

පී. ඒ. මාලිකා,<br>ලේකම් හා බලතල කාර්යය, කර්තව්‍ය<br>ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>කොලොන්න ප්‍රාදේශීය සභාව.

| අනු. අංකය | *I වන තීරුව* *දැන්වීම් පුවරු සහ ප්‍රචාරක දැන්වීමක්* | *II වන තීරුව* *අවසර ලබා දෙනු ලබන කාල සීමාව* | *III වන තීරුව* *එක් වර්ග අඩියක් සඳහා ගාස්තුව රු.* |
|---|---|---|---|
| 01 | ඉටි රෙදි හෝ රෙදිවලින් නිම කළ ප්‍රචාරණ දැන්වීමක් සඳහා වර්ග අඩියකට | මාස 06ක් සඳහා | 25.00 |
| 02 | ඩිජිටල් තාක්ෂණය මගින් නිම කළ ප්‍රචාරණ දැන්වීමක් සඳහා වර්ග අඩියකට | වසරක් සඳහා | 40.00 |
| 03 | වෙළෙඳ නාමය සහිතව වානේ වලින් නිම කරන ලද ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | වසරක් සඳහා | 75.00 |
| 04 | ආලෝක සංඥා නාම පුවරු සඳහා වර්ග අඩියකට | වසරක් සඳහා | 100.00 |
| 05 | අදාළ ව්‍යාපාරික ස්ථානයේ නමට අමතරව එම නාම පුවරුවේ වෙනත් වෙළෙඳ නාමයක් ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | වසරක් සඳහා | 150.00 |
| 06 | සභාව සතු දැන්වීම් පුවරු බදු දීම | වසරක් සඳහා | 100.00 |

05-145/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.